## ආයෙමත් ක්‍රිකට්

කාලෙකට ඉස්සෙල්ල අපි රටක් විදිහට ක්‍රිකට් ගැන කතා කළේ මාර ගැම්මකින්. දැං ඒක බරපතළ විදිහට වෙනස් වෙලා කියලා අමුතුවෙන් කියන්න ඕනෙ නැහනෙ. කොටින්ම දැං පාටි වලදි ක්‍රිකට් මාතෘකාවක් වෙන්නැති තරම්. අපේ සෙට් එක ක්‍රිකට් වලට කරන දේ දැක්කම එහෙම වෙන එකේ වරදක් දකින්නත් බැහැ. මාත් ඊයෙ පෙරේදා වෙනකල් හිතාගෙන හිටියෙ එහම තමයි. ඒත් ඔන්න ඔහේ කියලා මෙල්බන් වල තියෙන ක්‍රිකට් මැච් එක බලන්න



ටිකට් ගන්න විපරම් කරද්දිශ්‍රී ලන්කන් කළාපයේ සේරම ටිකට් අළෙවි වෙලා. ෆුල් හවුස්. මටම හිනා. ඒ පාර ඉතින් ගත්තා ජෙනරල් පැත්තේ ටිකට් එකක්. වැඩේ කියන්නේ කොච්චර බැන්නත් ඒක බහුතරයකගේ ඇඟට ජීර්ණ වෙලා තියෙන්නෙ මැච් එක දවස ළං වෙද්දි නොගිහින් බැරි ගානට. ඉතින් යනවා.

කොහොම වුණත් චූටි මල්ලි නම් ඉන්නේ ක්‍රිකට් ගැන හැබෑ කළකිරීමෙන්. ඒක ගහන එවුන්ගේ ඉඳලා ක්‍රීඩා ඇමතියා දක්වා පැතිරුණ එකක්. ඒක මේ මැච් පරදින නිසාම ඇතිඋන එකක් නෙවෙයි. දිනන පරදින එක මේ ගේම් එනේ ස්වභාවයනෙ. අද මේ ඇච්චෝ සෙට් එක සවුත් ඇෆ්රිකන්ස්ලගෙන් කන කෑම 2002 දී ක්‍රිකට් ඔස්තාර්ලා බන්දැද්දිත් කෑවේ. එව්වා එහෙම තමයි. ඒක නෙවෙයි මට තියෙන ප්‍රශ්නෙ. අපේ මේ ඉන්න සෙට් එක ගේමට බැස්සම ඇඟට දැනෙන ගතියක් නැති එකයි. අපේ එවුන් ටික ග්‍රවුන්ඩ් එකේදි පේන්නෙ හගේ පන්තියෙ කොල්ලො ටිකක් කැම්පස් එවුන් එක්ක මැච් එකක් ගහනවා වගේ. ඊට හපන් බැට් කිරිල්ල. ඒක නිකං දෙකේ පන්තියේ වගේ. ඇයි යකෝ අඩි පහමාරක් උස ක්‍රිකට් ගහන්න පුලුවන් එවුන් ලංකාවෙ ඇත්තෙම නැද්ද? හයක් ගහන්න පුලුවන් ඇඟපත තියෙන එකෙක්...? අනේ මන්දා.. මෙහෙම ගිහින් අපි ක්‍රිකට් වලින් ඉස්සර ගත්ත ආතල් එක කවදා ගන්නද කියලා මට හිතෙනවා.

එකක් පැහැදිළියි. ශ්‍රී ලංකාවේ ක්‍රිකට් නොපිට ගැසිය යුතුමයි. ඒක පැත්තකින් තියමුකෝ. පහුගිය දවස් වල අවසන් වුණ කේඑෆ්සී බිග්බෑෂ් එකේ හරිනේක් ටීම් එක එක්ක සෙල්ලම් කරන්න ආපු අපේ සංගා ටීම් එකෙනුත් ඩ්‍රොප්වෙලා වතුර බැට් පිට්ටනිය මැද්දට අදින හැටි දැක්කම සර්වාංගෙම සලිත වෙලා ගියා. ක්‍රිකට් වල නීතිය එහෙම තමයි. ඒත් සංගා කියන්නේ ලෝක පූජිත ක්‍රීඩයෙක්නෙ. අපේ ජාතික වීරයෙක්නෙ. එහෙම මිනිහෙක් මුදලට ක්‍රීඩා කරන්න ඇවිත් පිට්ටනියට වතුර අදික තත්වෙල පත්වුණාම ඒක එයාට ගාණක් නැති වුණත් ක්‍රිකට් වලට බොක්කෙන්ම ලව් කරන අපට දැනෙන වේදනාව නම් අපමණයි. සංගා එක්ක ක්‍රිකට් ගහපු කට්ටිය ඒ තරගාවලියෙ ඉන්න ලෙවල් එක දැක්කමත් සංගා වතුර බැට් උස්සගෙන පිටටනිය මැදට දුවන හැටි දැක්කම පිස්සු හැදුනා සහෝ.

මේව උන එක එක විදිහට තර්ක කරන්න පුලුවන්. ඒත සහෝ මිනිස්සුන්ගෙ කොලිටිය? සටේටස්? එක අතකට ඒව ගැන කතා කරන්න අපි කවුද සංගට ඕව කියලා දෙන්න. ඒත අවංකව කියන්නේ මැච් එකක් අම්බානකට පරදිනවට වඩා ඒ දර්ශනය මගේ පපුවට වැදුණා ලොක්කා.

## සැමට අධ්‍යාපනය

මේ සටහන උපුටා ගත්තෙ චාමර ජනරාජ් පිරිස්ගෙ ෆේස්බුක් පිටුවෙන්, මේ කතාවට චූටි මල්ලිත් එකඟ නිසයි උපුටා ගත්තෙ,

*"සාදුකින් පෙලෙන උන් දැන් ඉතීන් නැගිටියව් . අන්තිම සටනට සැරසියව්" සමාජවාදී පක්ෂ නියෝජනය කරන සහෝදරවරුනි. මේ කතාවට පොඩ්ඩක් ඇහුම්කන් දෙන්න. සමාජවාදී පක්ෂ චන්ද පදනම නියෝජනය කරන ප්‍රතිශතයෙන් වැඩිම කොටසක් ඉන්නේ දරිද්‍රතාවයෙන් පෙලෙන මිනිස්සු. උන් සමාජවාදය කියලා හිතාගන ඉන්නේ අමුතුම දෙයක්. උන් හිතාගන ඉන්නේ තියෙන එකාගෙන් අරගන නැති එකාට දෙන එක තමයි සමාජවාදය කියන්නේ කියලයි.*

*සල්ලි තියෙන පවුලක ඉපදුන ළමයෙක් ලෝකේ කොහේ හරි ඉහිල්ලා ඒ ළමයා ඉගෙනගන්නවා. ඒ ළමයාගේ දෙමව්පියෝ කොහොම හරි ඒ දේ ඒ ළමයට කරලා දෙනවා. අපේ රටේ මායිමේ තියෙන ඉන්දියාවේ ඉඳලා ඈත කැනඩාවේ , ඕස්ට්‍රේලියාවේ තියෙන විශ්ව විද්‍යාල වලින් හරි ඒ ළමයි උපාධි ගන්නවා. ඒ ළමයි අධ්‍යාපනය අවසන් කරද්දී අඩුම තරමේ රුපියල් ලක්ෂ සීයක් වත් දෙමව්පියෝ ඒ ළමයින්ට වියදම් කරනවා. ඒක තමයි ඇත්ත. එහෙම කරන්න එපා කියන්න කාටවත් පුලුවන්ද? දැන් ලංකාවේ පවුද්ගලික විශ්වවිද්‍යාල කොච්චර තියෙනවද? කොයිතරමක් උපාධි පාඨමාලා ඒවායේ උගන්වනවාද? ඒවායින් ඉවරකරපු ළමයි කොයිතරම් ප්‍රමාණයක් ලංකාවේ රස්සා කරනවද කියල දන්නවද? නැහැ මේ*



*එකක්වත් ඔහෙලා දන්නේ නැහැ. මොකද ඔහෙලා නියෝජනය කරන්නේ ඒ සමාජ පන්තිය නෙවෙයි. ඒ නිසා ඔයාලට ඒවා අදාළ නැහැ. ඒ කැම්පස් ඇතුලේ ඔහෙලට ශිෂ්‍ය සංවිධාන හදනවා තියා දොරෙන් අතුලටවත් අරගන්නේ නැහැ. ඒකනේ ඇත්ත.? සහෝදරවරුනි මෙන්න මේකයි වෙන්න ඕන. සල්ලි තියෙන එකා කොහොමත් ඉගෙනගන්නවා. කැම්පස් එක දශමෙන් මිස් උන එකා දුප්පත් නම් ඒ ළමයාගේ අනාගතේ අඳුරු වෙනවා. අන්න එහෙම ළමයින්ට ඉගෙනගන්න පුළුවන් වෙන ක්‍රමයක් වෙනුවෙන් සටන් කරන්න. ඒ ළමයින්ට ආණ්ඩුවෙන් සහන නය මුදලක් අනුමතකරවල ළමයා ඉගෙනගන රස්සාවක් කරද්දී ඒ ණය කපාගන්න පුළුවන් වැඩපිළිවෙලක් හදලා දීපියව් කියලා රජයට බලකරන්න. අන්න ඒකයි වෙන්න ඕන. උඹලා උඹලගේ චන්ද පදනම රැකගන්න ඒ මිනිස්සුන්ගේ දරුවෝ වෙනුවෙන් වැඩපිළිවෙලක් ඉල්ලලා සටන්කරනවා මිසක් සල්ලි තියෙන උන්ට ඉගෙනගන්න දෙන්න එපා කියලා ගොන් විදිහට සටන් කරන්න එපල්ලා.*

*අනෙක් කාරනාව තමයි අපොස උපෙ*




*විභාගයෙන් උසස් අද්‍යාපනය මනින්න යන්න එපා. ඒක අමුම අමු ගොන් වැඩක්. අපොස උපෙ විභාගයෙන් ලමෙක්ගේ මොලේ තරම මනින්න බැහැ . රටක අපොස උපෙ වගේ සම්මත විභාගයක් පවත්වන්නේ විශ්වවිද්‍යාලයට යනවද නැද්ද කියන එක තීරණය කරන්න කියලා හිතාගන ඉන්න එකම අමුම අමු ගොන් කමක්. හැමෝටම අධ්‍යාපනය ලබාගත හැකි වැඩපිළිවෙලක් මිසක් සල්ලි තියෙන උන් ඉගෙනගන්න එපා වගේ කතා කියන්න එපල්ල.*

*"සැමට පාන් ලැබෙන තුරු කාටවත් කේක් නැත" කියලා ලෙනින් ඒ දවස් වල කිව්වට දැන් ඒ සටන් පාඨ කල් ඉකුත් වෙලා. අද කාලෙට සෙට් වෙන්නේ නැහැ.*

## මරු ආරක්ෂාව

මොන තරම් ආරක්ෂක විධිවිධාන තර කරළා පැය 24 ම ඇලට් එකේ හිටියත් හදිසි සිදුවීම් වෙන්නෙ කිසිවෙකුටවත් සිතාගත නොහැකි විදිහට. අපි බොහෝ විට පුරුදු පුහුණු වෙලා ඉන්නෙ අතීත සිදුවීම් විශ්ලේෂණය කර ඊට ගැළපෙන ලෙස ප්‍රතික්‍රියා දක්වන්නනේ. ඒත් අපි පුරුදු වෙලා ඉන්න දේට බරිබාහිරව යමක් සිදුවුණොත් ඊට ප්‍රතිචාර දක්වන්න යන කාලය වැඩියි. ඒ නිසාම එහි ප්‍රතිඵලයත් දරුණු සහ බෙදජනක වෙන්න ඉඩ තියෙනවා.

පහුගිය දවසක මෙල්බන් සිටි එකේ




ෆ්ලින්ඩර්ස් ස්ට්‍රීට් ස්ටේෂන් එක ඉස්සරහා සිදුවුණ සිදුවඹ ඊට හොඳ උදාහරණයක්. අර පිස්සු හාදයා කාර් එක වට ගණනාවක් ස්යේෂන් එක ඉස්සරහා කරකවලා ගිහින් පදික වේදිකාව උඩ හිටපු කීප දෙනෙක් යට කරල තවත් කීපදෙනෙකුට මරු කැඳවන කම් පොලිසියට හරි ආරක්ෂක අංශ වලට හරි ඊට ප්‍රතික්‍රියා දක්වන්න හැකිවුණේ නැහැ. ඒක ඉතා කණගාටුදායක බරපතළ තත්වයක්. අඩුම තරමේ කාරයේ ටයර් එකකට වත් වෙඩි තබා ගමන නතර නොකළේ මන්ද කියලා හැමෝම අහනවා.ඒක මාර ප්‍රශ්නයක්. සිද්දිය ටීවී එකේ ප්‍රචාරය වෙද්දි හිතෙන්නේ මේ මිනිහා කොයි තරම් නිදහසේ තමන්ගෙ පහත් අරමුණ ඉටුකර ගත්තාද කියා නොවේද? මේ සිදුවීම ඒ මොහොතේම සජීවීව දුටු කීප දෙනෙකුගේම අදහස වුණේ මෙයමයි. මහජන මුදලින් නඩත්තු වන මහජන ආරක්ෂක සේවා මෙවැනි සිද්ධියකදී ක්‍රියාත්මක වෙන්නෙ මේ ආකාරයට නම් මහා බියකරු තත්වයකදි ප්‍රතිඵලක කුමක් වේවිද?

මේ ලෝකය හරිම විෂමයි. විවිධයි. දරුණු මිනිසුන්ගේ සිත් වැඩ කරන්නේ මහ අමුතු විදිහට. ඒකට වයස් බේධයක් නැහැ. මේව දැක්කම මට මතක් වේන්නේ අපේ ජේ ආර් පප්පා කිව්ව දෙයක්.

"තමන්ගේ ආරක්සාව තමන් විසින්ම සපයා ගත යුතුයි"

## එල්ලුම් ගහ

අපරාධකරුවන්ට නිසි දඬුවම් දිය යුතුයි කියන එකට චූටි මල්ලි එකඟයි. මේ රටේ වැරදිකරුවන්ට ලිහිල් දඬුවම් දීම වගේ දේවල් දකිද්දි චූටි මල්ලිට තරහා යන එකත් ඇත්තයි. ඒත් චූටි මල්ලි මරණ දඬුවම දීමට නම් එකඟ නැහැ.

මේ කතාව ලිව්වේ ඕසට්‍රේලියාවේ අවසන් වරට මිනිසකු එල්ලා මරා වසර 50ක් ගතවීම සම්බන්ධයෙන් තිබුණ පත්තර වාර්තා කියවීමෙන් පස්සෙයි.

අන්තිම වතාවම ඔස්ට්‍රේලියාවෙ මිනිහෙක් එල්ලා මැරුවෙ 1967 දි. පෙබරවාදි 3. මිනිහගෙ නම රොනල්ඩ් රයන්. මිනිහ 1965 දි වික්ටෝරියාවෙ පෙන්ට්රිජ් බන්ධනාගාරයෙන් පැනල යද්දි බන්ධනාගාරෙ ගාඩ් කෙනක්




වෙලා හිටිය ජොජ් හොඩ්සන් ව මරා දැමීම නිසයි මරණ දඬුවම ලැබුණෙ.

රොනල්ඩ් රයන් එල්ලා මැරුවට පස්සේ මරණ දණ්ඩනයට විරුද්ධව ඔස්ට්‍රෙලියා පුරා විශාල විරෝධතා පැතිරුණා. ඒ නිසා 1985 දි ඔස්ට්‍රෙලියාවේ මරණ දණ්ඩනය අහෝසි කළා.

මිනීමරුවන් සීයක් එල්ලා මරද්දි එක අහිංසකයෙක් ඒ අතරින් වැරදිකාරයෙක් වෙලා එල්ලා මැරුවොත් ඒක කොයි තරම් පාපයක්ද? එහෙම අහිංසකයන් කී දෙනෙක් එල්ලුම්ගස් ගිහින් තියෙනවද?

ලංකාවෙත් මරණ දණ්ඩනයට නියම වෙච් බර ගාණක් හිර ගෙවල් ඇතුළෙ ඉන්නවා. ඒත් ලංකාවෙ නම් තාමත් මරණ දඬුවම නීතිගතයි.

ලංකාවෙ පාලකයො තීන්දු තීරණ ගන්න පණ බයයි.

**චූටි මල්ලි**